# ප්‍රවෘත්ති අධ්‍යක්ෂකට පහරදීම සහ ඇමතිවරයෙකු ගුටි නෑම



මේ කලින් වතාවක මර්වින් සිල්වා (සුදු ඇඳ ඉදිරියේ) තම තග් බොඩිගාඩ්ලා සමග පත්තර කන්තෝරුවකට පහරදීමට යමින්



හිසෙන් මුහුණෙන් ලේ පෙරෙන මර්වින් සහචරයන් සමග හමුදා සහායෙන් තම කාර් එක ඇතුළට වදී

**ගි**ය දෙසැම්බර් මස 27වෙනි බ්‍රහස්පතින්දා කොළඹ බෞද්ධාලෝක මාවතේ ජාතික රූපවාහිනී සංස්ථාවට රජයේ සුඛොපොභෝගී වාහන කීපයක් ඇවිත් කලබලයේ නතර කළේ ය. ඉන් බැසගත් පිරිසේ නායකයා වූයේ ශ්‍රීලංකා රජයේ කම්කරු ඇමති මර්වින් සිල්වා ය. ඔහු මේ ආවේ සුහද සාකච්ඡාවකට නොවේ. ඔහු ආවේ රූපවාහිනි සේවයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂකවරයා වන ටී. එම්. ජී. චන්ද්‍රසේකර මහතාට තම තේජස පෙන්වීම සඳහා ය.

ඊට දින දෙකකට පෙර මාතර දී පැවති මහානාම පාලම විවෘතකිරීමේ උත්සවයේදී ගරු ජනාධිපතිතුමා ඇතුළු සම්භාවනීය පිරිස ඉදිරියේ මර්වින් සිල්වා ඇමතිවරයා විසින් කරන ලද කතාව රූපවාහිනියේ රාත්‍රි 10 ප්‍රවෘත්ති සේවයෙන් විකාශනය නොකිරීම ඔහුගේ කෝපයට හේතුවී ඇති අතර ඔහුගේම වචන වලින් කියන පරිදි මේ ආවේ දෙකෙන් එකක් බේරාගැනීමටත් ප්‍රවෘත්ති අධ්‍යක්ෂකට හොඳ පාඩමක් ඉගැන්වීමටත්ය. මර්වින් සිල්වා සමග පැමිණ සිටි ඔහුගේ පුද්ගලික ආරක්ෂකයින් හෙවත් බොඩිගාඩ්ලා කොළඹ හා ඒ අවට දාමරික ක්‍රියා ගැන නම් දැරූ අයයි. බොහෝ දෙනා ඔවුන් හඳුන්වන්නේ කුඩු ලාල්, කුඩු නුවන් සහ බෝම්බ සමන් යන අයිආර්සී නම් වලිනි. ඔවුන් අපරාධවලට සම්බන්ධව දඩුවම් විඳි අය බව ද කියති.

මර්වින් සිල්වා, චන්ද්‍රසේකරගේ කමිසයෙන් කොලරයෙන් අල්ලා ඇසුවේ මාතර රැස්වීමේ කළ තම දේශනය විකාශනය නොකිරීමට තරම් හයියක් ආවේ කොහොමද යන්නයි. ඒ සමගම මර්වින් සමග සිටි තග් බොඩිගාඩ්ලා චන්ද්‍රසේකර මහතාට පහර දී ඇදගෙන ගොස් රූපවාහිනී සභාපතිවරයා වන ආචාර්ය ඇතුගලගේ කාමරයට දැම්මේ ය. චන්ද්‍රසේකර අමාරුවෙන් දනි පනිගා ඔවුන්ගෙන් මිදී කාමරයෙන් එළියට දුව යත්ම මැරයෝ යළිත් ඔහු පසුපස පන්නා ගොස් පහර දී යළිත් කාමරය තුළට ඇදගෙන ආහ.

මේ පහර දීම සංස්ථාවේ සෙසු සේවක පිරිස් දුටු නිසා ඇසිල්ලකින් මුළු රූපවාහිනී සංස්ථාවම දෙබරයකට ගල් ගැසුවාක් මෙන් කැළඹී කළබල වී ගියෙන් එදා රැකියාවට පැමිණ සිටි සිය ගණනක් පිරිස සභාපතිගේ කාමරය වෙතට දුවගෙන ආහ. කාමරයට ඇතුල් වූ කොටසක් මර්වින්ටත් තගාලාටත් පිටවිය නොහැකි පරිදි දොර වසා දැමූහ. මේ පුවත ඉතා ඉක්මනින් අල්ලපු වත්තේ වූ ගුවන් විදුලි සංස්ථාවට ද සැළවිය. ඔව්හු ද දුවගෙන ආහ. මොබයිල් පෝන් මගින් ආරංචිය මාධ්‍ය ආයතන වලටද පැතිර ගියෙන් සිරස ආයතනය ටෙලිවිෂන් කැමරාද ගෙන කඩිනමින් පැමිණියේ ය.

රූපවාහිනිය දැඩි රැකවරණය ඇති තැනකි. එදා ද එහි ආරක්ෂක සේවය පිටතින් පැමිණි කිසිවෙකුට ඇතුල්වෙන්නට ඉඩ නුදුන් නමුත් රූපවාහිනිය ඇතුළේ සේවය කරන මාධ්‍යවේදීහු කෙසේ හෝ ආරක්ෂක නියාමකයින්ට කරුණු කියා තම මිතුරු මාධ්‍යවේදීන් ඇතුළට ගත්හ. මේ පුවත රජයේ මැති ඇමතිවරුන්ට ද සැළවූයෙන් වහා පොලීසිය හා කමාන්ඩෝ භටයින් එතැනට එවන ලදී. මර්වින් ඇතුළු මැරවර බොඩිගාඩ්ලා ඒවන විට පිටවී යා නොහැකි ප්‍රාණ ඇපකරුවන් බවට පත්ව රූපවාහිනී සභාපතිගේ කාමරයේ සිටියහ. පිටවීයන්නට දෙන්නේ කළ පහරදීමට ඇමතිවරයා සහ තගාලා චන්ද්‍රසේකර මහතාගෙන් හා රූපවාහිනියෙන් සමාව ඉල්ලුව හොත් පමණයයි සේවකයෝ කීහ.

බැරිම තැන අපි සමාව ගන්නවා යයි අමාරුවෙන් මර්වින්ගේ සහ කුඩු නුවන් නමැති තග් ප්‍රහාරකයාගේ කටින් කියැවිණ. ඔවුන්ට කාමරයෙන් එළියට එන්නට ලැබුණේ එවිටය. හමුදා භටයෝ ඉතා අමාරුවෙන් රැස්කන සෙනග ගෙන් බේරාගෙන ඇමතිවරයා සහ ඔහුගේ සහචරයන් එළියට ගෙන ආහ. ඒ එන අතරමග ඔවුන්ගේ හිසට හා ඇඟට හතර වටින්ම නොසෑහෙන ගුටි පූජාවක්ද ලැබිණ. සමහරු තගාලාගේ ඔළු බිත්තියේ හැප්පූහ. කාන්තාවෝ ටොකු අනිමින්ද, සෙරෙප්පු වලින්ද පහර දුන් බව කියති.

තවත් කවුදෝ රෝස පාට තීන්ත බාල්දියක් ගෙනැවිත් ඇමති මර්වින්ගේ ඔළුවට වත් කළේය. තීන්තවලින් නැවුණු ඇමතිවරයා පාසැල් පොතේ ඇති සායම් භාජනයේ වැටුණු නරියාගේ පෙනුමට සමාන විය. වාහනයේ නැගුණු මර්වින් සිල්වා කෙලින්ම ගියේ රෝහලේ ගෙවන වාට්ටුවට පැළුණු ඔළුවට බෙහෙත් දමාගන්නටය.

මේ සියළු දේට මූලික වුණු මාතර මහානාම පාලම විවෘත කරන රැස්වීමේ ඇමති මර්වින් සිල්වා කළ කතාව ඉතාම අශෝභන හා අසභ්‍ය වචන වලින් පිරුණු එකක් බවත් එය රූපවාහිනියෙන් කිසිසේත් රටේ මහජනතාව වෙත විකාශනය කිරීමට සුදුසු එකක් නොවන බව බොහෝ මාධ්‍යවේදීහු කියති. මර්වින් සිල්වා ඒ කතාවෙන් බණ්ඩාරනායක පවුලට ද, මංගල සමරවීර මහතාට ද, ඔහුගේ පියාවන අභාවප්‍රාප්ත මහානාම සමරවීර මහතාටද අපහාස වන විදියේ නොමනා ලෙස කතා කළ බවත් ඒ ඇසූ මාතර ජනතාව දැඩිසේ කලකිරුණු බවත් අසන්නට ලැබේ. එහි තවත් අප්‍රසන්න පැත්තක් නම් ජනාධිපතිවරයා ද ඒ මොහොතේ ඒ වේදිකාවේම කතාව අසා සිටීමයි. රූපවාහිනිය එම කතාව විකාශනය නොකළේ එසේ කළා නම් රජය අප්‍රසාදයට ලක්වන නිසා ය. සැබැවින්ම රජය ඒ පිළිබඳව රූපවාහිනියට ප්‍රශංසා කළ යුතුය. එහෙත් ඒ වෙනුවට රජය රූපවාහිනිය වරදකරු කරන්නට මහන්සි ගන්නා බව පෙනෙන්නට තිබේ.


මර්වින් සිල්වා මෙතෙක් රටට ජනතාවට කරන ලද අබමල් රේණුවක තරම් හොඳක් නැත. එහෙත් ඔහු කාලයක් තිස්සේ දාමරිකව පිස්සු බල්ලෙකු සේ හැසිරේ. සියළුම දෙනා එක හඬින් කියන්නේ රටට අපකීර්තිය ගෙනෙන මර්වින් සිල්වා නමැති නරුමයා බිඳක්වත් පමා නොවී වහා පන්නාදැමිය යුතු බවයි. එහෙත් ඔහු තවමත් ජනාධිපතිවරයාගේ ආදරයට පාත්‍රව සිටින්නේ ඇයිදැයි තවම කිසිවෙකුට විසඳාගත නොහැකි ගැටළුවකි.

♦ **හේම කුලරත්න** Sri Lanka



# සපත්තුව කකුල සඳහාය

**ම**ම පුංචි කාලෙදි අපේ ලෙකු මාම ඉදහිට කියන කියුමක් තිබුණා... උඹල දැනගනිල්ලා සපත්තු තියෙන්නෙ කකුලෙ දාන්න මිසක් ඔළුවෙ දාන්න නොවෙයි... ඒක අමතක කරන්න එපා....'' මාම එහෙම කිව්වට ඒ මොන කාරණයක් හන්දද කිව්වෙ කියලා මට කිසිම නිනව්වක් තිබුණෙ නෑ. ඔය කතාව මාම කියන්නෙ ටිකක් බීලා ඉන්න වෙලාවට. මට හිතුනෙ ඒක මේ වෙරි මරගාතෙ කියන දෙයක් විදියටයි. ඒනිසා මම ඒක කිසිම ගාණකට ගත්තෙ නැහැ.





හුඟ කාලෙකට පස්සෙ තමයි මට ඒ කියපු දේ තේරුණේ. මේ ජනසමාජෙ විශේෂයෙන් ලාංකික සමාජෙ පුද්ගල ආශ්‍රයෙදි මට ඒත්තු ගියා ඒ මාම කියපු දේ සම්පූර්ණ ඇත්ත බව. දැන් මාම ජීවතුන් අතර නැහැ. ඒත් ඒ මාමගෙ කියමනේ විශාල වටිනාකමක් තියනවා. ඒක සදා කාලෙටම ගැලපෙනවා.

ඒ කියමනේ වාචික තේරුම මේකයි. සපත්තුව සාදා තිබෙන්නෙ පයේ ලෑමට. ඒක කිසිසේත් ශරීරයේ වෙනත් තැනකට ගැලපෙන්නෙ නැහැ. සපත්තුව තිබිය යුතු ස්ථානය තමයි කකුල. ඉන් එහාට වෙන තැනක් නැහැ. ඒ කියමන ඊට වඩා පුළුල් අර්ථයෙන් ගත්තොත් මේ විදියයි. සමාජයෙ විවිධ අංශවල විවිධ තරාතිරම් වල රැකියාවල් තියෙනවා. යම් රැකියාවක් සමහර විට සමාජ මට්ටමෙන් ගත්තොත් පහතම රැකියාවක් වෙන්න පුළුවන්. ඒ තැනක වැඩකරන කෙනෙක් ඒ තැනින් ඉවතට අරන් වෙනත් උසස් තැනකට පත් කළාම, ඒ උසස් තත්වය ඔහුට දිරවන්නෙ නැහැ. රැකියාවෙන් පුද්ගලයා මනින ලංකාව වගේ සමාජෙක මේ කාරණය ඉතා තදින් බලපානවා. එහිදි ඔහුගෙ හීනමානය මතුවෙලා එනවා. අසංවර ගති මතුවෙලා එනවා. ඉතා පහත් විදියට හැසිරෙනවා, ඒ උසස් තත්වය ඔහුට පුරුදු නැති නිසා. කොටින්ම මුඩුක්කුවක හැදුණු රස්තියාදුකාරයෙක් කොම්පැනියක ඩිරෙක්ටර් තනතුරට පත් කළොත් ඉතා ඉක්මනින් ඔහුගේ රස්තියාදු ගතිය මතුවෙලා එනවා. ඒක කාටත් හොඳට පේනවා. ඔහු දන්නවා ඔහුගේ අතීතය සහ වංහුං බොහෝ දෙනෙක් දන්නා බව. ඒක මකා ගන්න ගිහිං ඔහු අන්තිම පිරිහෙන නරුම වැඩ කරනවා.

දැනට සති දෙකකට පෙර ලංකාවෙ සිද්ධවෙච්ච මර්වින් සිල්වා නාඩගම මේ මම කියාගෙන ආපු දේට හොඳම නිදසුන. මර්වින් සිල්වා මම අහල තියෙන විදියට හරි ඉගෙනීමක් ලබපු කෙනෙක් නොවෙයි. රැකියාව හැටියට ඒ පැත්තෙ රූණෙ සමූපකාරෙක බඩු කිරපු මිනිහෙක්. පස්සෙ මැති ඇමති වරු න්ට පන්දම් අල්ලලා ඔවුන්ට දරදිය ඇදලා උඩට ආපු මිනිහෙක්. එයාගේ හරි වතගොත දකුණෙ මිනිස්සු දන්නවා. ඒවා පත්තරවලත් ගියා. මර්වින් සිල්වා චන්ඩියෙක් වත් එඩිතර මිනිහෙක්වත් නෙවෙයි. මිනිස්සු කටින් බය කරගෙන ඉන්නෙ. හුඟ දෙනෙක් හිතන්නෙ මිනිහා පාතාලයේ ලොකු කෙළිකාරයෙක් කියලා. ඒ කතා සේරම බොරු. මර්වින් සිල්වා තනිකරම කඩදාසි පඹයෙක්. ඔහුගෙ ඒ චරිතය පුම්බලා තිව්වෙ මාධ්‍ය සහ ලංකාවෙ ඕපදූප පත්තර කාරයො. මම දැක්කා ගිය අවුරුද්දෙ ඔහු පාර්ලිමේන්තුවෙ දි අත අඹරවා අඹරවා දෙමළ මන්ත්‍රීලා ඉන්න පැත්තට ගියා ගහන්න කියලා. දෙමළ මන්ත්‍රී කෙනෙක් ''හා හොඳයි වරෙන් චණ්ඩියා '' කියලා මර්වින්ගෙ ඉස්සරහට ආවා. මර්වින් ඉක්මනට ගිහිං වාඩිවුණා.

කවුද තව ගොන් බාස් කෙනෙක් දුන්නා ආචාර්ය පට්ටමක් මර්වින්ට. ඒ තමයි ලොකුම තකතිරුකම. ඒක දුන්න ගමන් මර්වින් තනිකරම වළං කඩේට පැන්න ගොනා වුණා. ආචාර්ය පට්ටමක් දෙන්න සුදුසු මිනිස්සු ලංකාවෙ නැතුවටද මර්වින්ට දුන්නෙ. ඒකම ඇති ලංකාවෙ අද තත්වය තේරුම් ගන්න. රත්තරන් මුද්දක් අසූචි වළක දැම්ම වගේ වැඩක්. උපාධියකට කරපු ලොකුම අගෞරවය ඒක. ආචාර්ය පට්ටම බැලුවෙත් නැහැ, ඇමති පට්ටම බැලුවෙත් නැහැ මිනිස්සු මර්වින්ව අල්ල ගෙන මූණ කට සමතලා වෙන කල් ගැහුවා. මර්වින් ගුටි කකා සමාව ඉල්ලුවා. මේ සියල්ලෙම වැරදිකාරයො තමයි මර්වින්ගෙ වාචාල කතා, කුණුහරුප කැලි අහ අහ හිනාවෙච්ච පාර්ලිමේන්තුවෙ කතානායක ඇතුළු මැති ඇමතිවරු. ඒ කවුරුහරි මර්වින්ට ඒකාලෙම දබරැහිල්ල පෙන්නුව නම් මෑන් ගිය සතියෙ අර විදියට ගුටිකන්නෙ නැහැ. ආණ්ඩුවට අගෞරවේකුත් නැහැ. මර්වින් වගේ අය මීට ඉස්සරත් ඉඳලා තියෙනවා. ඒක අපේ ඉතිහාසෙන් පේනවා. සුබ යස කතාව ඒවගේ දෙයක්. ලංකාවෙ මොට්ට රජෙක් දොරටුපාලය එක විනාඩියකට සිහසුනේ වාඩි කෙරෙව්වා. එච්චරයි. වෙච්ච දේ දන්නවා නේ. ඒ මෝඩකම ලංකාවෙ ආයිත් කළා. මේ වගේ වැඩ විනාසය මිසක් රටකට යහපතක් ගේන්නෙ නැහැ. ඉතිහාසෙනුත් පාඩම් ඉගන ගන්නෙ නැති රටක් ලංකාව. මාම කියපු දේ හරි. කකුලෙ දාන සපත්තුව කකුලෙම දාපල්ලා..... ඒක වෙන තැනකට ඔබින්නෙ නෑ.....!

♦ **වෙලේගෙදර රාළ** London

# හවුන්ස්ලෝ ජනහඬ පදනම

**බ**ටහිර ලන්ඩනයේ හවුන්ස්ලෝ පෙදෙසේ ක්‍රියාන්විත ශ්‍රී ලංකා සංවිධානයක් වන හවුන්ස්ලෝ **ජනහඬ පදනම** ගිය දෙසැම්බර් 22 දින **Feltham Assebly** ශාලාවේ දී සංගීත ප්‍රසංගයක් හා ගායනා තරඟයක් පැවැත්වීය. විශාල ශ්‍රීලාංකික පිරිසක් සහභාගිවූ එහි තරුණ ආධුනික ගායක ගායිකාවෝ දක්ෂ ලෙස සිය කුසලතා දැක්වූහ. අවසානයේ දී ජයග්‍රාහකයින්ට තෑගි ද ප්‍රදානය කරන ලදී.



වමේ සිට ගී ගායනා තරඟයේ තෙවන තැන දිනූ, චාමර පෙරේරා, ප්‍රථම තැන දිනූ, ටීලා රන්ජනී සහ දෙවන තැනට ආ, රවීන්ද්‍ර බිබිලේ මෙහි වෙති



ජනහඬ පදනමේ සභාපති ශ්‍රීලාල් ඩයස් මහතා එදින ප්‍රසංගයේ ආරාධිත අමුත්තන් වන ලන්ඩනයේ නියෝජ්‍ය ශ්‍රීලංකා මහකොමසාරිස්වර ගණේගම ආරච්චි මහතා සහ හවුන්ස්ලෝ නගරසභාවේ ජගදීශ් ෂර්මා මහතා පිළිගත් අවස්ථාවයි මේ.